සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
Co-operative Employees Commission (Southern Province)
සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.

| මගේ අංකය / எனது இல / My No. | SP/CEC/1/O/5 | ඔබේ අංකය / உனது இல / Your No. | | දිනය / திகதி / Date | 2022.03.21 |
|---|---|---|---|---|---|

චක්‍රලේඛ අංක 01/2022

දකුණු පළාතේ සියළුම සමූපකාරවල සභාපතිවරුන් වෙත,

**<u>දකුණු පළාත් සමූපකාර සේවකයින්ගේ අතිරේක හා ජීවන වියදම් දීමනාව</u>**

දකුණු පළාතේ සේවය කරන සමූපකාර සේවකයින් විසින්, වර්තමාන ජීවන වියදමට සරිලන ලෙසට වැටුප් වැඩිකිරීමක් හෝ යම් දීමනාවක් වැඩිකරන ලෙසට කරනු ලබන විවිධ ඉල්ලීම් සළකා බලා දැනට ගෙවනු ලබන අතිරේක දීමනා සහ ජීවන වියදම් දීමනාව සංශෝධනය කිරීමට මෙම කොමිෂන් සභාව තීරණය කර ඇත.

02. ඒ අනුව 2012.04.04 දිනැති අංක 63/2012 දරණ චක්‍රලේඛය, ඊට අනුශාංගික 2012.04.30 දිනැති 63/2012(I) හා 2015.03.03 දිනැති අංක 01/2015 දරණ චක්‍රලේඛ මෙයින් අවලංගු කරන අතර, 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, දකුණු පළාතේ සියලු සමූපකාර සේවකයින්ට රු.5000.00 ක අතිරේක දීමනාවක් ගෙවීමට තීරණය කර ඇත. මෙම අතිරේක දීමනාව සමූපකාර සේවකයින්ගේ පාරිතෝෂිත දීමනා, සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක කර නොගත යුතුය.

03. එසේම, 2019.01.28 දිනැති 01/2019 චක්‍රලේඛය මගින් නියම කර ඇති රු.2000/- ක් වූ ජීවන වියදම් දීමනාව මෙයින් අවලංගු කරන අතර, 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, දකුණු පළාතේ සියලුම සමූපකාර සේවකයින්ට රු.2,500/- ක ජීවන වියදම් දීමනාවක් ගෙවීමට තීරණය කර ඇත. මෙම ජීවන වියදම් දීමනාව සමූපකාර සේවකයින්ගේ පාරිතෝෂිත දීමනා, සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක කර ගත යුතුය.

04. මෙම අතිරේක හා ජීවන වියදම් දීමනාව තාවකාලික, අනියම්, ආදේශක,කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින්ට මසකට දින 21කට වඩා වැඩිපුර සේවය සපයා ඇත්නම් සම්පූර්ණ දීමනාව ද, දින 21 කට වඩා අඩුවෙන් සේවය කර ඇත්නම්, ඔවුන් වැඩ කළ දින ගණන පදනම් කර ගෙන ද ගෙවිය යුතුය.

ලේකම් / செயலாளர் / Secretary 091-2232794 | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer 091-2234279 | කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax 091-2234383 | වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site www.cec.sp.gov.lk | විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail empcommicoopsp@sltnet.lk

05. මෙම අතිරේක දීමනාව සහ ජීවන වියදම් දීමනාව සාමූහික ගිවිසුම්, අවබෝධතා ගිවිසුම් සහ පඩිපාලක සභා මගින් වැටුප් තීරණය කරනු ලබන සමුපකාර සමිතිවල සේවකයින්ට නොගෙවිය යුතුය.

ජයන්ත පී.ලියනගේ.
ලේකම්(වැ.බ),
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

ලේකම්
සමූපකාර සේවක කොමිෂන් සභා
දකුණු පළාත

පිටපත 1. ලේකම්, කෘෂිකර්ම,ගොවිජන සංවර්ධන ........ සමූපකාර අමාත්‍යාංශය - දැ.ගැ.ස.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්, දකුණු පළාත - දැ.ගැ.ස.
3. දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුවට